*සියලුම හිමිකම් ඇවිරිණි.*

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II** | **පැය තුනයි**

# ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි:-**

(i) **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

(1) 'ව්‍යවසායකත්වය'මෑත කාලීනව බිහි වූ සංකල්පයකි. එය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,

(1) පරිසරයේ ඇති අවස්ථා හඳුනාගෙන වෙනස් ආකාරයට සිතමින් නවෝත්පාදන බිහිකිරීමක් ලෙසය.
(2) අනාගතය වෙනස් කිරීම සඳහා උත්සාහ කරන පුද්ගලයින්ගේ චර්යාවන් ලෙසය.
(3) සහජයෙන් උරුම වූ දක්ෂතාවල එකතුවක් ලෙසය.
(4) සමාජයේ යහපතට හේතුවන ක්‍රියාකාරකම්වල එකතුවක් ලෙසය.

(2) නව භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියට විවිධ සම්පත් අවශ්‍ය වේ. ඒවා නිෂ්පාදන සාධක ලෙස හඳුන්වයි. නිෂ්පාදන සාධක ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) අමුද්‍රව්‍ය, ඉඩම්, වනාන්තර හා පස.
(2) ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ.
(3) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය.
(4) ශ්‍රමය, නව අදහස්, භාණ්ඩ හා සේවා.

(3) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) අසමත් සිසු දරුවන් උදෙසා ප්‍රායෝගික තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හඳුන්වනු ලබන්නේ,

(1) නිර්මාණශීලී ව්‍යවසායකත්වය ලෙසය.
(2) සමාජයීය ව්‍යවසායකත්වය ලෙසය.
(3) ආයතනික ව්‍යවසායකත්වය ලෙසය.
(4) පාරිසරික ව්‍යවසායකත්වය ලෙසය.

(4) මූලික අවශ්‍යතා ඇතුළත් වගන්තිය තෝරන්න.

(1) අධ්‍යාපනය, ගමනාගමනය, දුම්රිය, පාසල්
(2) ආහාර, නිවාස, ආරක්ෂාව, අධ්‍යාපනය
(3) ඇඳුම් පැළඳුම්, නිවාස, බත්, පාන්
(4) දුරකථනය, අධ්‍යාපනය, සන්නිවේදනය, රූපවාහිනිය

(5) ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට තාර්කික විසඳුම් සොයා ගැනීම.

(1) ප්‍රායෝගිකකරණයයි.
(2) නිර්මාණශීලීත්වයයි.
(3) ප්‍රතිව්‍යුහගත කිරීමයි.
(4) තර්කානුකූල පදනමක පිහිටීමයි.

(6) මෙතෙක් භාවිතයට එක් වී නොතිබූ නව භාණ්ඩයක් හෝ සේවාවක් හෝ ක්‍රියාවලියක් හෝ බිහිකිරීම,

(1) අනුකරණය කිරීමක් ලෙස හඳුන්වයි.
(2) සංකලනයක් ලෙස හඳුන්වයි.
(3) නව සොයා ගැනීමක් ලෙස හඳුන්වයි.
(4) දිගුවක් ලෙස හඳුන්වයි.

(7) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම සම්බන්ධ සියලු කටයුතුවල නිරත වන්නා හඳුන්වනුයේ ,

(1) නිෂ්පාදකයා ලෙසය.
(2) ව්‍යාපාරිකයා ලෙසය.
(3) ව්‍යවසායකයා ලෙසය.
(3) ගබඩා භාරකරු ලෙසය.

(8) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කමක් පෙන්නුම් කරන ප්‍රකාශය තෝරන්න.

(1) අවශ්‍යතා විවිධයි. වුවමනා මූලිකයි.
(2) අවශ්‍යතා මූලිකයි. වුවමනා විවිධයි.
(3) අවශ්‍යතා සංකීර්ණයි. වුවමනා විවිධයි.
(4) අවශ්‍යතා අසීමිතයි. වුවමනා සීමිතයි.

(9) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන සේවාවක දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,

(1) ස්පර්ශ කල නොහැකි බවයි.
(2) සමජාතීය බව ආරක්ෂා කළ හැකිවීමයි.
(3) සම්පූර්ණයෙන්ම ගබඩා කළ හැකිවීමයි.
(4) සේවාව සපයන්නාගෙන් බැහැරට ගමන් කරන බවයි.

(10) අභ්‍යන්තර ව්‍යාපාර පරිසරය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන සාධක වන්නේ,

(1) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ,සම්පත්
(2) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ, ගනුදෙනුකරුවෝ
(3) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සැපයුම්කරුවෝ, ආයෝජකයෝ
(4) ආයෝජකයෝ, කළමනාකරුවෝ, සේවකයෝ, තරඟකරුවෝ

(11) සමාජ ප්‍රශ්නවලට නිර්මාණශීලීව විසඳුම් ඉදිරිපත් කළ මහත්මා ගාන්ධි තුමා, මාරි කියුරි මැතිණිය, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර වැනි ශ්‍රේෂ්ඨයන් කුමන ව්‍යවසායක වර්ගයට අයත් වන්නේද?

(1) අභ්‍යන්තර ව්‍යවසායකයෝ.
(2) සමාජීය ව්‍යවසායකයෝ.
(3) ව්‍යාපාර ව්‍යවසායකයෝ.
(4) නිර්මාණශීලි ව්‍යවසායකයෝ.

(12) පොලිතින් භාවිතය හේතුවෙන් මෑත කාලීනව විවිධ පරිසර ප්‍රශ්න මතුවිය. එයට විසඳුම් ලෙස විවිධ උපායමාර්ගයන් ක්‍රියාත්මක විණි. එම ක්‍රියාකාරකම් අයත් වන පරිසරය,

(1) ප්‍රජා පරිසරයයි
(2) දේශපාලන හා නෛතික පරිසරයයි.
(3) තාක්ෂණික පරිසරයයි
(4) සමාජ හා සංස්කෘතික පරිසරයයි.

(13) “ශදුඅත” විශ්ලේෂණයේ ( SWOT Analysis)අන්තර්ගත සාධක වනුයේ,

(1) ශක්ති, දුර්වලතා, අභියෝග,තර්ජන
(2) ශක්ති, දුර්වලතා, අවදානම්,තර්ජන
(3) ශක්ති, දුර්වලතා, අවස්ථා, තර්ජන
(4) ශක්ති, දුර්වලතා, අධිෂ්ඨාන,තර්ජන

(14) නව නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවසායකයකුට විවිධ ක්‍රමවේද භාවිතා කළ හැකිය. මේද රහිත කිරි වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම,

(1) ආදේශ කිරීමකි. (2) ඉවත් කිරීමකි.
(3) එකතු කිරීමකි. (4) සම්බන්ධ කිරීමකි.

(15) ලොව පුරා රටවල් දේශ සීමාවන්ගෙන් බැහැරව, සම්බන්ධ වී කටයුතු කිරීමේ ප්‍රවණතාව,

(1) ආසන්න පරිසරය ලෙස හැඳින් වේ.
(2) ප්‍රජා විද්‍යාත්මක පරිසරය ලෙස හැඳින් වේ.
(3) තාක්ෂණික මෙවලම් භාවිතයෙන් ජාලගත වීම වේ.
(4) නව විද්‍යාත්මක පරිසරය ලෙස හැඳින් වේ.

(16) ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා මූලික ධනයක් අවශ්‍ය වේ. එම ප්‍රාග්ධන අවශ්‍යතාව පහසුවෙන්ම සපුරාගත හැකි වන්නේ,

(1) ගනුදෙනුකරුවන්ගෙන් අත්තිකාරම් ලබාගැනීමෙන්
(2) බැංකු ණය හා කල්බදු ණය ලබා ගැනීමෙන්
(3) ස්වකීය ඉතුරුම් භාවිතා කිරීමෙන්
(4) ස්වකීය වත්කම් විකිණීමෙන්

(17) මෑතකදී පෙර පාසල් ඩිප්ලෝමාවක් හදාරා අවසන් කළ නිමාලි, පෙර පාසලක් ආරම්භ කිරීමට සුදුසුම ස්ථානයක් සොයමින් සිටී. ඒ සඳහා වඩාත් සුදුසු ස්ථානය තෝරන්න.

(1) නිවාස සංකීර්ණයකට ආසන්න ආරක්ෂිත, නිස්කලංක පරිසරයක් තිබීම.
(2) කර්මාන්ත පුරයකට ආසන්න ස්ථානයක් තෝරා ගැනීම.
(3) වෙළෙඳ සංකීර්ණයකට ආසන්න ස්ථානයක් තෝරා ගැනීම.
(4) ප්‍රධාන ක්‍රීඩා පිටියකට ආසන්න ස්ථානයක් තෝරා ගැනීම.

(18) වෙළෙඳපල හිඩැස යනුවෙන් අදහස් වන්නේ,

(1) වෙළෙඳපොලේ පාරිභෝගිකයන් නොසිටීම.
(2) වෙළෙඳපොලේ සිටින පාරිභෝගිකයන් භාණ්ඩ මිලදී නොගැනීම.
(3) තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා සහිත පාරිභෝගිකයන් සිටීම.
(4) තෘප්තිමත් වූ පාරිභෝගිකයින් පිරිසක් සිටීම.

(19) "අදහස් ශත 10 ට දූසිමක් ගත හැකිය." යනු ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති ප්‍රසිද්ධ කියමනකි. මෙයින් ගම්‍ය වන්නේ,

(1) ව්‍යාපාර අදහස් සුලභ බවය.
(2) ව්‍යාපාර අදහස් ලාභදායක බවය.
(3) ව්‍යාපාර අදහස් මුදල් ගෙවා ලබාගත යුතු බවය.
(4) ව්‍යාපාරයක් කිරීමට අවස්ථා සුලභ බවය.

(20) නලින් පළතුරු බීම වෙළෙඳසැලක් ආරම්භ කිරීමට අදහස් කර ඇත. ඒ සඳහා හොඳම ව්‍යාපාර අවස්ථාව වන්නේ,

(1) තරඟකරුවන් බහුලව සිටීම.
(2) තම නිවස ආසන්නයේ ප්‍රසිද්ධ පාසලක් පිහිටා තිබීම.
(3) රාජ්‍ය දිරිගැන්වීම් නොමැති වීම.
(4) අවාසිදායක නීති රීති පැනවී තිබීම.

(21) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයක් නොවන්නේ,

(1) අදහස නීතිරීතිවලට අනුකූල වීම.
(2) අදහස සඳහා අවශ්‍ය සම්පත් සපයාගත හැකිවීම.
(3) අදහස මත පදනම් වන භාණ්ඩය සඳහා ඉල්ලුමක් පැවතීම.
(4) අදහස සඳහා පදනම් වන භාණ්ඩයට අධික තරඟකාරීත්වයක් පැවතීම.

(22) ඔබේ පාසලේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රදර්ශනය කර ඇති පාසලේ වාර්ෂික ලිත ඔබ දැක ඇතැයි සිතමු.එය මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය,

(1) උපාය මාර්ගයකි.
(2) සැලසුමකි.
(3) අලංකාරයට තබා ඇති පුවරුවකි.
(4) ගුරු මණ්ඩලයේ අවධානය පිණිස තබා ඇති පුවරුවකි.

(23) විධායක සාරාංශයක, අලෙවිකරණ සැලසුමේ අන්තර්ගත වන කරුණක් වන්නේ,

(1) ලාභදායිත්වය පිළිබඳවය.
(2) අනාගත ආයෝජකයින්ගේ තොරතුරුය.
(3) නිෂ්පාදන පිළිබඳවය.
(4) ඉලක්කගත පාරිභෝගික තොරතුරුය.

(24) වෙළෙඳපල විශ්ලේෂණයට අවශ්‍ය තොරතුරු විවිධ ආකාරයෙන් රැස්කරගත හැකිය. ඒ සඳහා භාවිතා කළ හැකි හොඳම ක්‍රමය වන්නේ,

(1) පාරිභෝගිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම.
(2) පාරිභෝගිකයන්ට ත්‍යාග හා ප්‍රශංසා ලබාදීමය.
(3) නිෂ්පාදකයන් සමඟ සාකච්ඡා කිරීමය.
(4) පාරිභෝගිකයන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමය.

(25) අලෙවි සැලැස්මක විකුණුම් පුරෝකථනය අධ්‍යයනය කිරීමෙන් ආයෝජකයෙකුට,

(1) ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය පිළිබඳ තොරතුරු දැනගත හැකිය.
(2) ඉදිරි නිශ්චිත කාලයකදී ව්‍යවසායකයා වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය දැනගත හැකිය.
(3) ව්‍යාපාරයේ පරිපාලන ව්‍යුහය සකස්වී ඇති ආකාරය පිළිබඳ අවබෝධයක්ලැබිය හැකිය.
(4) ව්‍යාපාරයේ මුදල් ආයෝජනය පිළිබඳ තොරතුරු ලබාගත හැකිය.

(26) කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළ තුසිත තමාගේ දියණියගේ නම ව්‍යාපාරයේ නමට ඉදිරියෙන් යෙදීමට අදහස් කර ඇත. ඒ අනුව ලියාපදිංචිය සඳහා යා යුත්තේ ,

(1) ග්‍රාම නිලධාරී කාර්යාලයට
(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට
(3) නගර සභාවට
(4) සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට

(27) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රාග්ධනය එකතු කරගත් සිතුම් තම සහෝදරයෙකු වන අසිත ද හවුල් කරගෙන රු. 600 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කර ඇත. ඔවුන්ට මග පෙන්වීමට ගණකාධිකාරිවරයෙකු හවුල් කර ගනී. ඔහු මුදලින් ප්‍රාග්ධනය නොයොදන අතර, තම ව්‍යාපාරික ඥානය හවුල් ව්‍යාපාරයට යොදවයි. හවුලේ ලාභ බෙදාගත යුත්තේ කෙසේද?

(1) අනුපාතයක් අනුවය.
(2) ප්‍රතිශතයක් මතය.
(3) සමානවය.
(4) 2:2:1 අනුපාතයටය.

(28) සීමාසහිත පෞද්ගලික සමාගමකට විශේෂිත වූ ලක්ෂණයක් වන්නේ,

(1) අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් කළමනාකරණය කිරීම.
(2) කොටස් ප්‍රසිද්ධියේ විකිණීම.
(3) කොටස්කරුවන් සංඛ්‍යාව 1 ත් 50 ත් අතර සිටීම.
(4) නෛතික පුද්ගලභාවයක් හිමිවීම.

(29) හවුල් ව්‍යාපාරයක් සීමිත පෞද්ගලික සමාගමක් ලෙස අනිවාර්යයෙන්ම ලියාපදිංචි කලයුත්තේ,

(1) කොටස් ප්‍රසිද්ධියේ විකුණන විටය.
(2) හවුල්කරුවන් සංඛ්‍යාව 20 කට වැඩිවන විටය.
(3) හවුල්කරුවන් සංඛ්‍යාව 50කට වැඩිවන විටය.
(4) හවුල්කරුවන්ගෙන් කිහිප දෙනෙක් ඉල්ලා සිටින විටය.

(30) කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක්, සිය වෙළෙඳ නාමය යටතේ එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපොල ප්‍රදේශයක අලෙවි කිරීමට බලය ලබාදෙන ව්‍යාපාර වර්ගය වනුයේ,

(1) වරලත් ව්‍යාපාර
(2) හවුල් ව්‍යාපාර
(3) සමුපකාර ව්‍යාපාර
(4) කේවල ස්වාමි ව්‍යාපාර

(31) ව්‍යාපාරයක් භාවිතා කරනු ලබන මෝටර් රථ වාහනය වාර්ෂිකව කරනු ලබන ක්ෂය කිරීම,

(1) නිෂ්පාදන පිරිවැයකි.
(2) පරිපාලන පිරිවැයකි.
(3) වෙනත් පිරිවැයකි.
(4) අලෙවිකරණ පිරිවැයකි.

(32) "කළමනාකරුවන් විසින් එහි අයිතිකරුවන්ගේ ආයෝජනයට උපරිම ප්‍රතිලාභ ලබාදීමට වෙහෙසිය යුතුය." මෙය,

(1) ආචාර ධර්ම පිළිබඳ වගකීමකි.
(2) කළමනාකරුවන්ගේ යුතුකමකි.
(3) සමාජ වගකීමකි.
(4) ආයෝජනයට ප්‍රතිලාභ ලබාදිය යුතු නිසාවෙනි.

(33) නිෂ්පාදන ආයතනයක ඒකකයක මිල නියම කිරීම සඳහා ඒකක පිරිවැය ගණනය කර ගැනීමට අවශ්‍යව ඇත. ඒ සඳහා භාවිතා කල හැක්කේ,

(1) මුළු නිෂ්පාදන පිරිවැය / ඒකක සංඛ්‍යාව
(2) ඒකක සංඛ්‍යාව / මුළු නිෂ්පාදන පිරිවැය
(3) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය / ඒකක සංඛ්‍යාව
(4) ප්‍රාථමික පිරිවැය / ඒකක සංඛ්‍යාව

(34) ලී භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් විශේෂිත අල්මාරි වර්ගයක් නිෂ්පාදනය කරයි. මේ සඳහා එක්තරා මාසයක නිෂ්පාදන පිරිවැය රු. 120 000 කි. නිෂ්පාදනය කළ අල්මාරි ගණන 10 කි. අල්මාරියක නිෂ්පාදන පිරිවැය වනුයේ,

(1) රු. 10 000/- කි.
(2) රු. 11 000/- කි.
(3) රු. 12 000/- කි.
(4) රු. 13 000/- කි.

(35) මූල්‍ය සැලසුමක් මඟින් ව්‍යවසායකයෙකුට ලැබෙන හොඳම ප්‍රතිලාභය වන්නේ,

(1) ව්‍යාපාරයට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනය කර ගැනීමට හැකිවීම.
(2) ව්‍යාපාර ප්‍රතිඵලය නිශ්චිතව ගණනය කරගත හැකිවීම.
(3) අපේක්ෂිත මුදල් ගලාඒම් හා ගලායාම් තීරණය කළහැකි වීම.
(4) මූල්‍ය ගැටළු හඳුනාගත හැකිවීම.

(36) කාන්තාවන් සාධාරණ හා විශ්වාස කළහැකි බවට සමාජය තුළ පවතින ආකල්පය කාන්තා ව්‍යවසායකත්වයට ඇති,

(1) බාධාවකි.
(2) අභියෝගයකි.
(3) ශක්තියකි.
(4) තර්ජනයකි.

(37) වර්තමානයේ කාන්තාවන් ව්‍යවසායකත්වය සඳහා යොමුවීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්වී ඇත. ව්‍යවසායකයෙකු වීමට කාන්තාවන් තුළ ඇති ශක්තියක් වන්නේ,

(1) කාලය නිසි පරිදි කළමනාකරණය කරගත හැකිවීම.
(2) ස්වයං විනයක් කාන්තාවන් තුළ පැවතීම.
(3) කාන්තාවන්ටම ආවේණික වූ කුසලතා යොදාගත හැකිවීම.
(4) ව්‍යාපාරික කාර්යයන් කළමනාකරණය කිරීමේදී ගැටළු විසඳා ගැනීමට හැකියාවක් තිබීම.

(38) කාන්තාවන්ට ව්‍යාපාර කරගෙන යාමේදී විවිධ බාධා පවතී. ඇතැම් විට එම බාධා ඔවුන් ව්‍යවසායකත්ව කාර්යයෙන් ඉවත්වීමට හේතු වී ඇත. කාන්තා ව්‍යවසායකත්වයට පවතින බාධාවකි.

(1) කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රමාණවත් වීම.
(2) සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අකමැත්ත.
(3) ප්‍රාග්ධනය සපයා ගැනීම පහසු වීම.
(4) කාන්තාවන් තුළ ස්වභාවයෙන් ම පවතින පිරිමැසුම් සහිත බව.

(39) ව්‍යවසායකයෙකුගේ සමාජ වගකීමක් ලෙස වඩාත්ම වැදගත් වන්නේ,

(1) පරිසර දූෂණය අවම කිරීම.
(2) සීමිත සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම.
(3) සේවක පුහුණුව හා සංවර්ධනය
(4) පුද්ගලයන්ට සම රැකියා අවස්ථා ලබාදීම.

(40) ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා රජයේ දිරිගැන්වීම් ව්‍යවසායකයන් පෙළඹවීමට හේතුවේ. ව්‍යවසායකයන් සඳහා පවතින මූල්‍ය දිරිගැන්වීමක් වන්නේ,

(1) තාක්ෂණික පුහුණුව ලබාදීම.
(2) වෙළෙඳපල සොයා දීම.
(3) සහන පොළී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබාදීම.
(4) ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට උපදෙස් දීම.

***

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**ව්‍යවසායකත්ව අධ්‍යයනය**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු**
**I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1 | 11. | 2 | 21. | 4 | 31. | 4 |
| 2. | 3 | 12. | 2 | 22. | 2 | 32. | 4 |
| 3. | 2 | 13. | 3 | 23. | 4 | 33. | 1 |
| 4. | 2 | 14. | 2 | 24. | 1 | 34. | 3 |
| 5. | 2 | 15. | 3 | 25. | 2 | 35. | 1 |
| 6. | 3 | 16. | 3 | 26. | 2 | 36. | 3 |
| 7. | 2 | 17. | 1 | 27. | 3 | 37. | 3 |
| 8. | 2 | 18. | 3 | 28. | 3 | 38. | 2 |
| 9 | 1 | 19. | 1 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 2 | 30. | 1 | 40. | 3 |

එක් නිවැරදි පිළිතුරකට ල.01 බැගින් මුළු ලකුණු 40x1 = 40

*සියළුම හිමිකම් ඇවිරිණි.*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x)දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"විකසිත" 2016 වසරේ පැවැති අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ වාණිජ අංශයෙන් ඉහළින් ම සමත් වූ තරුණයෙකි. ඔහු විශ්ව විද්‍යාලයට ඇතුළත් නොවී ඔහුගේ නිර්මාණශීලී හැකියාව ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරයි. පසුගිය කාලයේ පරිසර ප්‍රශ්න දෙස හොඳින් අධ්‍යයනය කර සිටි ඔහු, පානය කිරීමෙන් අනතුරුව තැන තැන විසිරී ඇති ඉවත ලන ප්ලාස්ටික් බෝතලය වෙනුවට වැඩි දියුණු කරන ලද නව වතුර බෝතලයක් වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමට සැලසුම් කරමින් සිටී.

ඔහුගේ සැලසුමට අනුව ඉතාම තුනීයට සකස් කළ කුඩා, මැටි වලින් තැනූ බෝතලයකට පානීය ජලය පිරවීමට හැකි පරිදි සකස් කර එම බෝතලය වටා කවුළු සහිත ප්ලාස්ටික් බෝතලයකින් ආවරණය කරනු ලැබේ. මේ නිසා බෝතලයේ ජලය මැටි කලයක මෙන් නැවුම් ජලය ලෙස රැඳෙන අතර භාවිතයෙන් අනතුරුව නැවත නැවතත් එම වතුර බෝතලය ප්‍රයෝජනයට ගැනීමට හැකියාව ඇත. මේ මඟින් පරිසර හානිය ද අවම වන අතර නැවුම් ජලය පානය කිරීමේ අවස්ථාව පාරිභෝගිකයන්ට ලැබෙනු ඇති බව ඔහුගේ විශ්වාසයයි.

ඉහත අවස්ථාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නවෝත්පාදනය සඳහා නමක් යෝජනා කරන්න.
(ii) මේ සඳහා සැලසුම් කිරීම අවශ්‍ය වන්නේද පැහැදිලි කරන්න.
(iii) ව්‍යාපාර සැලසුමක මූලිකාංග නම් කරන්න.
(iv) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට සහාය කර ගත යුතු ආයතන 02 ක් නම් කරන්න.
(v) අපේක්ෂිත නිෂ්පාදන ව්‍යාපාරය සඳහා තාක්ෂණික උපදෙස් ලබා ගත යුත්තේ කුමන ආයතනයෙන් ද?

විකසිත ආරම්භ කිරීමට යන ව්‍යාපාරයේ ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රවාහයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ඉඩම් සඳහා | රු. 1 000 000 |
| ගොඩනැගිලි | රු. 500 000 |
| උපකරණ සවි කිරීම | රු. 300 000 |
| ලියාපදිංචි ගාස්තු | රු. 25 000 |
| ව්‍යාපාර සැලැස්ම සඳහා | රු. 50 000 |
| අනෙකුත් වියදම් | රු. 75 000 |

<u>අපේක්ෂිත මාසික ආදායම්</u>

| | |
|---|---|
| වතුර බෝතල් අලෙවියෙන් | රු. 500 000 |
| හිස් භාජන ඇප තැන්පතු | රු. 50 000 |

ඉහත තොරතුරු ඇසුරෙන්

(vi) මුළු ජංගම නොවන වත්කම්වල වටිනාකම ගණනය කරන්න.
(vii) ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ගණනය කරන්න.
(viii) ව්‍යාපාරය, එදිනෙදා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය වියදම් හඳුන්වන නම සඳහන් කරන්න.
(ix) මුදල් ගලායාම් හතරක් දක්වන්න.
(x) මුදල් ගලා ඒම් දෙකක් දක්වන්න.

**(ලකුණු 2x10=20)**

02.

(i) 'ව්‍යාපාරික අවදානම' යන්න ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.
(ii) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති සමානකම් දෙකක් ලියන්න.
(iii) ව්‍යවසායකයාට හිමි වන ප්‍රතිලාභ හතරක් ලියන්න.
(iv) නව භාණ්ඩ හෝ සේවා උත්පාදනය කිරීමට ඇති හැකියාව නවෝත්පාදනයයි. නවෝත්පාදන සිදුවන ආකාර 2 ක් නම් කරන්න.
(v) නිර්මාණශීලීත්වය සාර්ථක ව්‍යවසායකයකු බිහිවීම සඳහා බලපාන සුවිශේෂී ගති ලක්‍ෂණයකි. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක දෙකක් ලියන්න.

**(ලකුණු 2x5=10)**

03. බොහෝ නවෝත්පාදන බිහි වී ඇත්තේ කුඩා පරිමාණ ව්‍යාපාර තුළිනි. ඔවුන්ට තම නිර්මාණශීලී චින්තනය අවදි කරමින් අලුත් නිෂ්පාදිත පිළිබඳව අත්හදා බැලීමට පහසු වේ.

(i) කුඩා පරිමාණ ව්‍යාපාරවල ගති ලක්‍ෂණ හතරක් ලියන්න.
(ii) කුඩා පරිමාණ ව්‍යාපාර කරගෙන යාමේදී බලපාන සීමාවන් දෙකක් ලියන්න.
(iii) කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකයා අයිතිකරු ලෙස තම ව්‍යාපාරය තුළ ඉටු කරන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.
(v) ව්‍යවසායකයකුට තමා තුළ තාක්‍ෂණික කුසලතා වර්ධනය කර ගැනීමෙන් තම ආයතනය තුළ කළ හැකි කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

**(ලකුණු 2x5=10)**

04. "ව්‍යාපාර ආයතනයේ කටයුතුවලට බලපෑම් කරනු ලබන ව්‍යාපාරයට පිටතින් ඇති සියලුම සාධක බාහිර සාධක ලෙස හඳුන්වාදිය හැකිය."

(i) ව්‍යාපාර බාහිර පරිසර සාධක 04 ක් සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් වන කළමනාකරුවන් ව්‍යාපාරයේ විවිධ කටයුතුවල නිරත වේ. එවැනි කටයුතු දෙකක් සඳහන් කරන්න.
(iii) වාර්ෂිකව පවත්වන දළදා පෙරහැර කුමන ව්‍යාපාර පරිසරයට අයත් වන්නේද යන්න සඳහන් කරන්න.
(iv) වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ තුන සඳහන් කරන්න.
(v) ශ්‍රී ලංකාවේ වර්තමානයේ නව සන්නිවේදන තාක්ෂණය ඔස්සේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මෙවලම කුමක්ද?

**(ලකුණු 2x5=10)**

05.

(i) අලෙවි සැලැස්මක අන්තර්ගතයන් 02 ක් නම් කරන්න.
(ii) වෙළෙඳපල විශ්ලේෂණයකට අවශ්‍ය තොරතුරු ලබාගත හැකි ක්‍රම 04 ක් නම් කරන්න.
(iii) පහත වගුවේ දැක්වෙන නිෂ්පාදිත සඳහා ආදේශකය බැගින් සඳහන් කරන්න.

| නිෂ්පාදිතය | ආදේශකය |
|---|---|
| 1. මී කිරි | ................................................ |
| 2. තේ, කෝපි | ................................................ |
| 3. බීම බෝතලය | ................................................ |

(iv) අලෙවිකරණ උපාය මාර්ග තේරීමේදී අලෙවි මිශ්‍රය ඉතා වැදගත් වේ. අලෙවි මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් මොනවාද?
(v) ව්‍යාපාරයේ අලෙවි හා බෙදා හැරීමේ කාර්යයන්ට සෘජුව අදාළ වන ජංගම නොවන වත්කම් 2 ක් සඳහන් කරන්න.

**(ලකුණු 2x5=10)**

06. "සීමිත සම්පත් භාවිතා කොට පාරිභෝගික අවශ්‍යතා සහ වුවමනා ඉටු කරන ආයතනයන් ව්‍යාපාර සංවිධානයක් ලෙස හඳුන්වයි."

(i) ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.
(ii) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග 03 ක් නම් කරන්න.
(iii) හවුල් ව්‍යාපාරවල මූලික ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.
(iv) සංස්ථාපිත සමාගම් සරලව අර්ථ දක්වන්න.
(v) වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙකක් නම් කරන්න.

**(ලකුණු 2x5=10)**

**07.** පූර්ණිමාගේ ව්‍යාපාරයේ 2017.01.01 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| තොගය | රු.40 000 | ණයගැතියෝ | රු. 150 000 |
| ණය හිමියෝ | රු.12 000 | මුදල් ශේෂය | රු. 18 000 |

ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනු

| | |
|---|---|
| විකුණුම් ආදායම | 356 000 |
| මාසය තුළ ගැනුම් | 120 000 |
| පරිපාලන වියදම් | 12 500 |
| විකුණුම් වියදම් | 180 000 |
| මූල්‍ය වියදම් | 8 000 |
| වෙනත් වියදම් | 2 000 |

ජනවාරි 31 දින රු. 23 000 තොග ඉතිරිව තිබුණි.

1) 2017.01.31 දිනට ඉතිරි මුදල් ශේෂය ගණනය කරන්න

**(ලකුණු 04)**

2) 2017.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පූර්ණිමාගේ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 10)**

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය.**

**Entrepreneurship Studies**

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය - I**

**අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

1. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) ව්‍යවසායකත්වයේ අරමුණ වනුයේ,
(1) පෞද්ගලික ලාභ ඉපයීම වේ. (2) පරිසරය ආරක්ෂා කිරීම වේ.
(3) ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වේ. (4) තමාට මෙන්ම සමාජයට ද යහපතක් කිරීම වේ

(02) පහත සඳහන් පිළිතුරු අතුරෙන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පමණක් අයත් පිළිතුර තෝරන්න.
(1) නම්‍යශීලීත්වය , අභිප්‍රේරණය , අධ්‍යාපනය (2) නිර්මාණශීලී බව , සුභවාදී බව , නායකත්වය
(3) නිර්මාණාත්මක බව , අධ්‍යාපනය ,නායකත්වය (4) සුභවාදී බව , නායකත්වය ,ගතානුගතික වීම

(03) ව්‍යවසායකයකු අවදානම් භාර ගැනීමේදී,
(1) සියලු අවදානම් භාර ගත යුතුය. (2) තමා කැමති අවදානම් භාර ගත යුතුය.
(3) සාර්ථක වීමේ ප්‍රණතාව වැඩි අවදානම් භාර ගත යුතුය (4) සියලු අවදානම් භාර නොගත යුතුය.

(04) ව්‍යාපාරික තීරණයක් සාර්ථක වීම හෝ අසාර්ථක වීම හැඳින්විය හැක්කේ,
(1) නිශ්චිතතාවක් ලෙස ය. (2) අභියෝගයක් ලෙස ය.
(3) තර්ජනයක් ලෙස ය. (4) අවිනිශ්චිතතාවක් ලෙස ය.

(05) රටක ජනගහනය විශාල වන විට ඔවුන්ගේ අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට වෙළඳපොළ ද වර්ධනය වේ.මේ පිළිබඳව හඳුනාගැනීමට ව්‍යවසායකයකු විසින් අධ්‍යයනය කල යුතු පරිසරය වනුයේ,
(1) ආර්ථික හා ප්‍රජා පරිසරයයි. (2) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරයයි.
(3) දේශපාලන හා නෛතික පරිසරයයි. (4) සමාජයීය හා සංස්කෘතික පරිසරයයි.

(06) ව්‍යවසායකයකු තම ව්‍යාපාරය සාර්ථක කර ගැනිම සඳහා වැය කරන ලද කාලයේ ප්‍රමාණය ව්‍යවසායකත්වයේ,
(1) ශක්තියකි. (2) තර්ජනයකි.
(3) පිරිවැයකි. (4) ප්‍රතිලාභයකි.

(07) සමාජ ව්‍යවසායකයින් බිහි වීමට හේතුවක් වන්නේ,
(1) පරිසර දූෂණය ය. (2) පරාර්ථකාමී බව ය.
(3) ස්වභාවික විපත්වල වර්ධනය ය. (4) දේශපාලන අරමුණු ඉටු කර ගැනීම ය.

(08) නිෂ්පාදන සඳහා දැනුම ලබා දීම, පිරිවැය අඩු කිරීම, පරිසර සංරක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය යනාදිය සම්බන්ධයෙන් ව්‍යවසායකයන්ට සපයන සේවා හැඳින්විය හැක්කේ,
(1) උපදේශන සහයන් ලෙස ය. (2) අලෙවි සහයන් ලෙස ය.
(3) තාක්ෂණික සහයන් ලෙස ය. (4) ආයෝජන හා කළමනාකරණ සහයන් ලෙසය.

(09) ව්‍යවසායකයකුට සිය භාණ්ඩ පිළිබඳව විදේශීය ගැනුම්කරුවකුට තොරතුරු සැපයීමට යොදා ගත හැකි උචිත ම සන්නිවේදන ක්‍රමය වන්නේ,

(1) සාකච්ඡා ය. (2) විද්‍යුත් තැපෑල ය.
(3) ලිපිය ය (4) දුරකථනය ය.

(10) ව්‍යපාර කටයුතු සඳහා භාවිතා කරන මානව සම්පත පිළිබඳ අධ්‍යයනයේ දී යොදා ගනු ලබන තත්ත්වය සහ අධ්‍යාපන මට්ටම යනු,

(1) ප්‍රජා විද්‍යාත්මක සාධක වේ. (2) ආර්ථිකමය සාධක වේ.
(3) මනෝ විද්‍යාත්මක සාධක වේ (4) සමාජ විද්‍යාත්මක සාධක වේ.

(11) ජංගම ගිණුමේ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් ලිවීමට දෙනු ලබන පහසුකම හඳුන්වන්නේ,

(1) වෙළඳ ණයක් ලෙස ය. (2) බැංකු අයිරාවක් ලෙස ය.
(3) දිගුකාලීන බැංකු ණයක් ලෙස ය. (4) කෙටිකාලීන බැංකු ණයක් ලෙස ය.

(12) පාර්භෝගිකයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පරිසරය වනුයේ,

(1) දේශපාලන හා නෛතික පරිසරය වේ. (2) ස්වාභාවික හා භූගෝලීය පරිසරය වේ.
(3) සමාජයීය හා සංස්කෘතික පරිසරය වේ. (4) ආර්ථික හා ප්‍රජා පරිසරය වේ.

(13) සමාන ගුණාංග පදනම් කර ගනිමින් වෙළෙඳපොළ කොටස් කිරීම.

(1) වෙළෙඳපොළ ඉලක්කකරණය වේ. (2) වෙළෙඳපොළ සමීක්ෂණය වේ.
(3) වෙළෙඳපොළ ඛණ්ඩනය වේ. (4) පාරිභෝගික ඉලක්කකරණය වේ.

(14) පාරිභෝගික හැසිරීම කෙරෙහි බලපාන සාධක අතර තනතුරු, ආර්ථික තත්වය,ජීවන රටාව යනාදිය වැදගත් වේ.

(1) සංස්කෘතික සාධක ලෙස ය. (2) පෞද්ගලික සාධක ලෙස ය.
(3) සමාජයීය සාධක ලෙස ය. (4) මනෝ විද්‍යා;මක සාධක ලෙස ය.

(15) කාන්තාවක් වීම කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනයේ ලා ඇති

(1) ශක්තියකි. (2) අභියෝගයකි.
(3) අවස්ථාවකි. (4) දුර්වලතාවයකි.

(16) භාණ්ඩ බෙදාහැරීමට සම්බන්ධ අතරමැදියකු නොවන්නේ,

(1) සිල්ලර වෙළෙන්දා ය. (2) තොග වෙළෙන්දා ය.
(3) නිෂ්පාදකයා ය. (4) නියෝජිතයා ය.

(17) අවසාන වාරිකය ගෙවා නිමවන තුරු භාණ්ඩයේ නීත්‍යානුකූල අයිතිය ගැණුම්කරු සතු නොවන ක්‍රමය හඳුන්වන්නේ,

(1) විලම්භිත ගෙවුම් ලෙස ය. (2) මූල්‍ය කල්බදු ලෙස ය.
(3) මෙහෙයුම් කල්බදු ලෙස ය. (4) කුලීපිට ගැනුම් ලෙස ය.

(18) ව්‍යාපාර කටයුතු ආරම්භකර පවත්වාගෙන යාම සඳහා පරිසරය සකස් කිරීම හඳුන්වන්නේ,

(1) තාක්ෂණික පහසුකම් ලෙස ය. (2) අලෙවි පහසුකම් ලෙස ය.
(3) යටිතල පහසුකම් ලෙස ය. (4) උපදේශන පහසුකම් ලෙස ය.

(19) මෝටර් රථ නිෂ්පාදකයකුට තීන්ත සැපයුම්කරුවකු යනු,

(1) ආදේශන ව්‍යාපාරයකි. (2) ඉදිරිපස ව්‍යාපාරයකි.
(3) පසුපස ව්‍යාපාරයකි (4) ප්‍රතිබද්ධ ව්‍යාපාරයකි.

(20) මහජන බැංකුව,
(1) ලියාපදිංචි මූල්‍ය සමාගමකි.
(2) බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.
(3) බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
(4) ලියාපදිංචි කල්බදු සමාගමකි.

(21) ව්‍යාපාරික අරමුණු හා පරමාර්ථ ද,ඒවා ඉටුකර ගන්නා අකාරය ද ඇතුලත් කර ගනිමින් පිළියෙල කරනු ලබන වාර්තාව,
(1) ව්‍යාපාර සැලැස්ම වේ.
(2) අය වැය සැලැස්ම වේ.
(3) මූල්‍ය සැලැස්ම වේ.
(4) නිෂ්පාදන සැලැස්ම වේ.

(22) ව්‍යාපාරයක නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ගනු ලබන භාණ්ඩ පිළිබඳ සටහන් කරන මූලික පොත,
(1) දෛනික විකුණුම් පොත වේ.
(2) ආපසු යැවුම් පොත වේ.
(3) ආපසු එවුම් පොත වේ.
(4) දෛනික ගැනුම් පොත වේ.

(23) වෙළඳ ණය හිමියන් යනු ව්‍යාපාරයක,
(1) ජංගම වත්කමකි.
(2) ජංගම වගකීමකි.
(3) ජංගම නොවන වත්කමකි.
(4) ජංගම නොවන වගකීමකි.

(24) ව්‍යාපාර අවස්ථා ඇගයීමේ අරමුනක් වනුයේ,
(1) ප්‍රතිලාභ උපරිම කිරීම.
(2) අවධානම මගහැරීම.
(3) සේවකයන් බඳවා ගැනීම ය.
(4) ව්‍යාපාරයට අරමුදල් ලබා ගැනීම ය.

(25) රජය විසින් දේශීය ව්‍යාපාර ආරක්ෂා කිරීමට විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය වෙනස් කිරීම ව්‍යාපාර කෙරෙහි බලපානුයේ,
(1) දේශපාලන හා නෛතික පරිසරය තුළින් ය.
(2) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය තුළිය ය.
(3) ආර්ථික හා ප්‍රජා පරිසරය තුළින් ය.
(4) සමාජයීය හා සංස්කෘතික පරිසරය තුළින් ය.

(26) ව්‍යාපාරික කටයුතුවලින් ඉපයූ ලාභය හඳුන්වනුයේ,
(1) වත්කමක් ලෙස ය.
(2) හිමිකමක් ලෙස ය.
(3) වගකීමක් ලෙස ය.
(4) වගවීමක් ලෙස ය.

(27) ව්‍යාපාරයක් ඉපයූ ශුද්ධ ලාභය ගණනය කරනුයේ,
(1) අමතර ආදායම් වලින් වියදම් අඩු කිරීමෙනි.
(2) දළ ලාභයට අමතර ආදායම් එකතු කිරීමෙනි.
(3) දළ ලාභයට අමතර ආදායම් එකතු කර විකුණුම්
(4) දළ ලාභයට අමතර ආදායම් එකතු කර වියදම්

(28) ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා වඩා වැදගත් වන කුසලතාවයක් වනුයේ,
(1) ගිණුම්කරණ කුසලතාවයි.
(2) පාලන කුසලතාවයි.
(3) කළමනාකරණ කුසලතාවයි.
(4) ව්‍යවසායකත්ව කුසලතාවයි.

(29) නිවාස ඉදිකිරීමේ නියැලෙන ව්‍යවසායකයකුට ගෘහ නිර්මාණ ශිල්පීන් යනු,
(1) ආදේශන ව්‍යාපාරයකි.
(2) ඉදිරිපස ව්‍යාපාරයකි.
(3) අත්‍යවශ්‍ය ව්‍යාපාරයකි.
(4)පසුපස ව්‍යාපාරයකි.

(30) ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම තුළින් ලැබිය හැකි වාසියක් වනුයේ.
(1) ව්‍යාපාරයට සේවකයන් බඳවා ගැනීම පහසු වීමයි.
(2) ව්‍යාපාරයට නෛතික පිළිගැනීමක් ඇති වීමයි.
(3) ව්‍යාපාරයේ කළමනාකරන තීරණ ගැනීම පහසු වීමයි.
(4) ව්‍යාපාරයේ සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීමයි.

(31) නිෂ්පාදිතයක මිලත්,පිරිවැයත් අතර වෙනස වනුයේ,
(1) දායකය වේ (2) ලාභය වේ.
(3) දළ ලාභය වේ. (4) විකුණුම් පිරිවැය වේ.

(32) ශ්‍රමයෙහි පිරිවැය වනුයේ,
(1) ආදායම වේ. (2) ලාභය වේ.
(3) වැටුප් වේ. (4) පිරිවැටුම වේ.

(33) මූල්‍ය තත්ව ප්‍රකාශනයක දැක්වෙන ණයගැතියන් ව්‍යාපාරයේ,
(1) ජංගම නොවන වත්කමකි. (2) ජංගම වත්කමකි.
(3) ජංගම වගකීමකි. (4) ජංගම නොවන වගකීමකි.

(34) ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ ව්‍යාපාරයේ වත්කම්, හිමිකම් සහ වගකීම් දැක්වෙන ප්‍රකාශය වනුයේ,
(1) ආදායම් ප්‍රකාශය යි. (2) මුදල් ප්‍රවාහ ප්‍රකාශය යි.
(3) මූල්‍ය තත්ව ප්‍රකාශනය යි. (4) ව්‍යාපාර සැලසුමයි යි.

(35) රු 60 000 ක මුදලක් ණය හිමියන්ට ගෙවීම, මූලික ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරනුයේ,
(1) වත්කම් අඩුවීම රු.60 000 වගකීම් අඩුවීම රු.60 000
(2) වගකීම් අඩුවීම රු.60 000 හිමිකම් අඩුවීම රු.60 000
(3) වත්කම් වැඩිවීම රු.60 000 වත්කම් අඩුවීම රු.60 000
(4) වත්කම් අඩුවීම රු.60 000 හිමිකම් වැඩිවීම රු.60 000

පහත සිද්ධිය කියවා අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජගත් සහ සනුක හොඳ මිතුරෝය. දෙදෙනා අතර වූ සුහද කතාබහකදී ජගත් සනුකට පැවසුවේ,කෙදිනක හෝ තමා දේශීය සම්පත් භාවිතකර ව්‍යාපාරයක් අරඹා ව්‍යවසායකයකු වන බවය. තවදුරටත් ඔහු පැහැදිලි කළේ තමාට ද, සමාජයට ද, රටට ද වැඩදායී පුද්ගලයකු වන බවය.

එහෙත් සනුකගේ අදහස වූයේ ඕනෑම පුද්ගලයකුට ව්‍යවසායකයකු විය හැකි බවත්,ඕනෑම කෙනකු වැඩිහිටියකු වීමේ දී ව්‍යවසායකත්ව කුසලතා නිරායාසයෙන්ම වර්ධනය වන බවත් ය. ;වද සනුක පැවසුවේ ජගත්ගේ සාමාන්‍ය චර්යා ස්වභාවය වන සමාජානුගත ආකල්ප හා විශ්වාස දැඩි ලෙස පිළිගැනීම,විවේචන හා අසාර්ථක වීම් සඳහා ඇති දැඩි බිය හා අකමැත්ත ජගත්ගේ සාර්ථකත්වය සීමා කරන බවත් ය.

(36) දේශීය සම්පත් උපයෝජනය කර ගනිමින් ව්‍යාපාර ආරම්භ කිරීම ව්‍යවසායකත්වයේ,
(1) තමාට සීමා වූ ප්‍රතිලාභයකි. (2) ජාතික මට්ටමේ ප්‍රතිලාභයකි.
(3) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිලාභයකි. (4) සංවර්ධන මට්ටමේ ප්‍රතිලාභයකි.

(37) විවේචන හා අසාර්ථක වීම සඳහා ජගත් තුළ ඇති දැඩි බිය හා අකමැත්ත සීමාකාරී සාධකයක් ලෙස බලපානුයේ,
(1) දැක්මට ය. (2) අවදානම් බාර ගැනීමට ය.
(3) නිර්මාණශීලීත්වයට ය. (4) පරිසර සංවේදීභාවයට ය.

(38) තමාට ද,සමාජයට ද, රටට ද වැඩදායී පුද්ගලයකු වීමට ජගත් තුළ පවතින සිහිනය හැඳින්විය හැක්කේ,

(1) නිර්මාණශීලීත්වය ලෙස ය. (2) ආත්ම විශ්වාසය ලෙස ය.
(3) දැක්ම ලෙස ය. (4) කැපවීම ලෙස ය.

(39) "පුද්ගලයින් වැඩිහිටියන් වීමේ දී ව්‍යවසායකත්ව කුසලතා නිරායාසයෙන්ම වර්ධනය වේ." මෙම ප්‍රකාශය,

(1) අසත්‍ය වේ. (2) සතය වේ.
(3) අර්ධ සතය වේ. (4) පූර්ණ සත්‍ය වේ.

(40) කෙදිනක හෝ ව්‍යවසායකයකු බවට පත් වීමට ජගත් තුළ ඇති දැඩි අධිෂ්ඨානශීලී බව,

(1) අවස්ථාවකි (2) තර්ජනයකි.
(3) ශක්තියකි (4) දුර්වලතාවයකි.

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**Entrepreneurship Studies**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. අ.පො.ස. සාමාන්‍ය පෙළ සඳහා ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂයක් ලෙස හදාරා ඇති කවිඳු ඉතා අධිෂ්ඨානශීලී හා නව අදහස් ඇති තරුණයෙකි. පාසලේ දී ලත් දැනුම මත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර පරිසරය විශ්ලේෂණය කිරීටම අවශ්‍ය බව දන්නා හෙයින් ඒ සඳහා තොරතුරු එකතු කළේය.කවිඳුගේ අවට ප්‍රදේශය තේ සහ කුරුඳු වගාකර ඇති කෘෂිකර්මයට බර වූ ග්‍රාමයකි.එහි දී පාසල හැර යන සංඛ්‍යාව අතර අ.පො.ස. සා.පෙළ විභාගයෙන් පසුව රැකියා නොමැතිව නිකරුනේ කාලය ගත කරන අය වැඩි වශයෙන් සිටීම,බැංකු ණය සම්බන්ධයෙන් ඉහළ පොළී අනුපාතිකයක් තිබීම තරුණ පාර්ශවයේ ආකල්ප වෙනස් වීම. ජීවන වියදම වැඩි වීම යන ගැටලු කවිඳුට හඳුනාගත හැකි විය.

I. "ව්‍යාපාර පරිසරය" ලෙස හඳුනාගත හැක්කේ කුමක් ද?

II. කවිඳුට බාහිර පරිසරය තුළින් හඳුනාගත හැකි වූ අවස්ථා හා තර්ජන එක බැගින් දක්වන්න.

III. කවිඳු හඳුනාගත් අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ඇරඹිය හැකි ව්‍යාපාර 2ක් යෝජනා කරන්න.

IV. සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම් සෙවීමට කවිඳු තුළ ඇති උත්සාහය හඳුනා ගත හැක්කේ කවර ව්‍යවසායකයෙකු ලෙසද?

V. සාර්ථක ව්‍යවසායකයකුවීමට කවිඳු වර්ධනයකර ගත යුතු කුසලතා 2ක් දක්වන්න.

කවිඳු විසින් හඳුනාගත් අවස්ථා ඇසුරෙන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණයකර එය ක්‍රමවත් සැලසුමකට අනුව පවත්වාගෙන යාමට අදහස් කළ අතර පහත සඳහන් වියදම් දැරීමට සිදුවන බව ඇස්තමේන්තු කර ඇත.

| | රු |
|---|---|
| ගොඩනැගිල්ල (අයිතිකරු යෙදවීම) | 1500 000 |
| බැංකු ණය ලබා ගැනීම (යන්ත්‍රයක් මිලදී ගැනීමට) | 200 000 |
| අවශ්‍ය උපකරණ | 500 000 |
| ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම | 30 000 |
| දුරකථන සම්බන්ධතාවය | 28 000 |
| ව්‍යාපාර සැලසුම් සැකසීමට වියදම | 30 000 |
| සමාරම්භක වියදම | 20 000 |
| ලියාපදිංචි හා නීතිමය කටයුතු සඳහා ගාස්තු | 8 000 |
| දෛනික වැටුප් | 24 000 |
| දෛනික වෙනත් ගාස්තු | 28 000 |

ඉහත තොරතුරු ඇසුරෙන් ,

VI. මුළු ආයෝජන ඇස්තමේන්තුගතකර දක්වන්න.

VII. ස්ථාවර වත්කම් වල වටිනාකම ගණනය කරන්න.

Viii. ආරම්භ කිරීමට පෙර වියදම කොපමණද?

IX. කවිදුගේ ව්‍යාපාරයේ මුදල් ගලායාම් 2 ක් දක්වන්න.

X. කවිදුගේ ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් එකක් දක්වන්න.

2.

I. ව්‍යවසායකයෙකු සහ ව්‍යාපාරිකයෙකු අතර දැකිය හැකි සමානතා 2ක් සහ වෙනස්කම් 2ක් දක්වන්න.

II. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට හිමිවන ප්‍රතිලාභ 4ක් දක්වන්න.

III. ව්‍යාපාර අදහසක් ක්‍රියාත්මක කිරීමේ දී ´අවදානම් ගැනීම´ යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

IV. කාන්තාවන් ව්‍යවසායකයකු වීම සඳහා පොළඹවන ගුණාංග 4ක් දක්වන්න.

V. වර්තමාන සමාජයේ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග 2ක් දක්වන්න.

3.

I. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන භාණ්ඩයක දැකියහැකි ලක්ෂණ 4ක් දක්වන්න.

II. පුද්ගලයකු තුළ ඇති අවශ්‍යතා 2ක් හා ඊට අදාළ වුවමනා 2 බැගින් දක්වන්න.

III. ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ 2ක් දක්වන්න.

IV. හවුල් ව්‍යාපාරයක ලක්ෂණ 2ක් දක්වන්න.

V. ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 4ක් දක්වන්න.

4.

I. සේවකයන් පෙළඹවීම හා අවශ්‍ය වන මග පෙන්වීම ව්‍යවසායකයාගේ කවර භූමිකාවක් දක්වයි ද?

II. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක 2ක් දක්වන්න.

III. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු 4ක් දක්වන්න.

IV. ඉලක්කගත පාරිභෝගිකයා යනුවෙන් අදහස් කරන්නේ කවුරුන් ද?

V. පහත සඳහන් භාණ්ඩ සඳහා ඉලක්කගත පාරිභෝගික කොටස දක්වන්න.

- ළමා කතන්දර පොත් -
- දඹදිව වන්දනා චාරිකා සඳහා ආයතන -

5.

I. ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම විවිධ නිර්ණායක අනුව සිදු කරයි. එසේ වර්ග කරන නිර්ණායක 2ක් දක්වන්න.

II. කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි වාසි 4ක් දක්වන්න.

III. ඔබගේ ප්‍රදේශයේ ව්‍යාපාරයක් ලෙස වගකීම සීමිත, නීතිමය පුද්ගලභාවයක් සහිත ව්‍යාපාරයක් ඇරඹීමට අවශ්‍ය නම් එයට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය සහ එය අදාළ පනත කුමක් ද?

IV. ව්‍යාපාර සඳහා රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතුවන කරුණු 2ක් දක්වන්න.

V. ව්‍යාපාර සම්බන්ධයෙන් සමාජ වගකීම් පිළිපැදීමෙන් සිදුවන ප්‍රතිලාභ 4ක් දක්වන්න.

6.

I. ´නිෂ්පාදන සැලැස්ම´ යන්නෙහි අදහස දක්වන්න.

II. නිෂ්පාදන සැලැස්මක ඇතුළත් කරුණු 2ක් දක්වන්න.

III. නිෂ්පාදන ක්‍රියාවලිය උදාහරණයක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

යෙදවුම් → පරිවාරක ක්‍රියාවලිය → නිමවුම

IV. වෙළෙඳපල විශ්ලේෂණයකට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ක්‍රම 2ක් දක්වන්න.

V. අලෙවි මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් (4Ps) හඳුන්වන්න.

7.

සඳුන් ව්‍යාපාරයක් ඇරඹීමට අපේක්ෂා කරන අතර 2018 වර්ෂයේ ව්‍යාපාර සැලැස්මේ පහත තොරතුරු ඔබට දී ඇත.

| | රුපියල් |
|---|---|
| සඳුන් ව්‍යාපාරයට යොදවන මුදල් | 800 000 |
| බැංකු ණය ලබා ගැනම | 300 000 |
| විකුණුම් ආදායම | 2000 000 |
| ණය හිමියන්ට ගෙවීම් | 50 000 |
| ණයවාරික ගෙවීම හා පොළිය | 75 000 |
| ණයගැති යන්නෙන් ලැබීම් 100 000 | |
| සේවක වැටුප් ගෙවීම | 100 000 |
| ජල බිල්පත් ගෙවීම | 20 000 |
| විදුලි බිල්පත ගෙවීම | 28 000 |
| ලියා පදිංචි ගාස්තු | 2 000 |
| විකිණීමට භාණ්ඩ මිලට ගැනීම | 900 000 |
| උපකරණ මිලට ගැනීම | 200 000 |

I. 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය දක්වන්න.

II. 2018 වර්ෂය අවසානයේ මුදල් ශේෂය දක්වන්න.

III. සඳුන්ට ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අවශ්‍ය වේ යැයි සිතා ඒ සඳහා අදාළ පනත හා උපදෙස් දක්වන්න.

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**Entrepreneurship Studies**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය**

# MARKING SCHEME - I,II

# පිළිතුරු පත්‍රය - I,II



අනුග්‍රහය :

# ව්‍යවසායකත්ව අධ්‍යයනය— I

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 4 | 11. 2 | 21. 1 | 31. 2 |
| 2. 2 | 12. 4 | 22. 4 | 32. 3 |
| 3. 1 | 13. 3 | 23. 2 | 33. 2 |
| 4. 4 | 14. 3 | 24. 1 | 34. 3 |
| 5. 1 | 15. 1 | 25. 3 | 35. 1 |
| 6. 4 | 16. 3 | 26. 2 | 36. 2 |
| 7. 2 | 17. 4 | 27. 4 | 37. 3 |
| 8. 4 | 18. 3 | 28. 4 | 38. 2 |
| 9. 2 | 19. 2 | 29. 3 | 39. 1 |
| 10. 3 | 20. 3 | 30. 2 | 40. 3 |

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

# පිළිතුරු පත්‍රය

1.

I. ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට අභ්‍යන්තර හා බාහිර වශයෙන් බලපෑම් ඇති කරන සාධක හා බලවේග ව්‍යාපාර පරිසරයයි.

II. අවස්ථා - අ.පො.ස. සාපෙළ විභාගයෙන් පසුව රැකියා නොමැති අය දැකිය හැකි වීම

තර්ජන - බැංකු ණය, ඉහළ පොළී අනුපාතය

III. අ) කුරුඳු පදනම් කර කුළු බඩු ලෙස අන්තර්ජාලය හරහා වෙළෙඳාම් කිරීම (කුඩා කණ්ඩායම් ලෙස)

ආ) තේ පැකට් අන්තර්ජාලය හරහා වෙළෙඳාම් කිරීම (කුඩා කණ්ඩායම් ලෙස)

ඇ) කුරුඳු කෝටු (ඉවතලන) ප්‍රයෝජනයට ගනිමින් මල් පෝච්චි හෝ වෙනත් නිර්මාණ කිරීම.

IV. සමාජයීය ව්‍යවසායකයකු ලෙස.

V. මානව කුසලතා

තාක්ෂණික කුසලතා

VI. මුළු ආයෝජන ඇස්තමේන්තු

| | යෝජිත ආයෝජන රුපියල් | | මුළු ආයෝජන රුපියල් |
|---|---|---|---|
| | අයිතිකරු යෙදවීම | බැංකු ණය | |
| ස්ථාවර වත්කම් | | | |
| ගොඩනැගිල්ල | 150 000 0 | | 1500 000 |
| යන්ත්‍රය | | 200 000 | 200 000 |
| උපකරණ | 500 000 | | 500 000 |
| මුළු ස්ථාවර වත්කම් | 2000 000 | 200 000 | 2200 000 |
| **ආරම්භ කිරීමට පෙර වියදම්** | | | |
| විදුලිය ලබා ගැනීම | 30 000 | | |
| දුරකථන සබඳතාවය | 28 000 | | |
| සැලසුම් සැකසීම | 30 000 | | |
| සමාරම්භන වියදම් | 20 000 | | |
| ලියාපදිංචි හා නීතිමය ගාස්තු | 8 000 | | |
| | 116 000 | | 116 000 |
| කාරක ප්‍රාග්ධනය | | | |
| දෛනික ව්‍යාපාර කටයුතු | 28 000 | | |
| වැටුප් | 24 000 | | |
| මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය | 52 000 | | 52 000 |
| මුළු ආයෝජනය | 2168 000 | 200 000 | 2368 000 |

VI.

| | රුපියල් |
|---|---|
| ගොඩනැගිල්ල | 1500 000 |
| උපකරණ | 500 000 |
| | 2000 000 |

VII.

| | රුපියල් |
|---|---|
| ව්‍යාපාර සැලසුම් කිරීම | 30 000 |
| දුරකථන සම්බන්ධතා | 28 000 |
| විදුලිය ලබා ගැනීම | 30 000 |
| ලියාපදිංචි කිරීම | 8 000 |
| සමාරම්භක වියදම | 20 000 |
| | 116 000 |

IX.

| | රුපියල් |
|---|---|
| දුරකථන සබඳතාවය සඳහා | 28 000 |
| සැලසුම් සැකසීම | 30 000 |

X. බැංකු ණය ලබා ගැනීම 200 000

2.

I. **සමානතා**

1. ආර්ථික කටයුත්තක යෙදීම
2. අවදානමකට මුහුණ දීම

**අසමානතා**

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| 1.පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නිර්මානශීලීව නවෝත්පාදන පදනම් කරගෙන ව්‍යාපාර කටයුතු කරයි . | ගතානුගතික හා සම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාර කටයුතු කරයි. |
| 2.තරඟය අභියෝග කර ගනී | තරඟයට මුහුණදීමට එතරම් කැමැත්තක් නොදක්වයි |

II. ආකර්ශනීය ලාභයක් ලැබීම

ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකිය

නිදහස හා ඉහළ තෘප්තියක් ලැබීම

සමාජයීය සුභසාධනයට දායක විය හැකි වීම.

III. ව්‍යාපාරය සාර්ථකවීමට හෝ නොවීමට තිබෙන ඉඩ ප්‍රස්තාවයි.

අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.

අවදානම පහළ නම් ප්‍රතිලාභය පහළ වේ.

IV. නම්‍යශීලීත්වය

කැපවීමෙන් වැඩ කිරීමේ හැකියාව

නිර්මාණශීලීත්වය

අවදානම් දැරීමේ ශක්තිය

V. ව්‍යාපාර ව්‍යවසායකයෝ

සමාජීය ව්‍යවසායකයෝ

3.

I.

- ස්පර්ශ්‍ය වීම
- ගබඩා කළ හැකි වීම
- සමජාතීය වීම
- සපයන්නන්ගෙන් වෙන් කළ හැකි වීම.

II. ආහාර - පාන්,බත්

නිවාස - තට්ටු නිවාස, පැල්පත්

III. පොදු අරමුණක් පැවතීම

සීමිත සම්පත් භාවිතය

IV. *හවුල්කරුවන් අවමය 2 සහ උපරිමය 20 දක්වා අතර සංඛ්‍යාවක් සිටීම

*හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතීම

V. * දේශීය සම්පත් භාවිතය.

* ප්‍රාදේශීය ලෙස සංවර්ධනය

* රැකියා අවස්ථා ඇති වීම

* රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යාම

4.

I. නායකයාගේ භූමිකාව

II.අයිතිකරුවෝ කළමණාකරුවෝ

III.* ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවාව

* ඉලක්කගත පාරිභෝගිකයෝ

* ප්‍රාග්ධනය සපයා ගැනීම

* තරඟයේ ස්වභාවය

IV.ව්‍යාපාරිකයා ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව කිනම් පාරිභෝගික කණ්ඩායමක් සඳහාද යන්නයි.

V. ළමා කතාන්දර පොත් - ළමුන්

දඹදිව වන්දනා චාරිකා සඳහා ආයතන - වැඩිහිටියන්

5.

I. * හිමිකාරත්වය අනුව * අරමුණ අනුව

II. * සුළු ප්‍රාග්ධනයකින් ඇරඹිය හැකිය.

* ආරම්භය පහසුය

* ස්වාධීන තීරණ ගත හැකිය.

* සියලු ලාභ අයිතිකරු සතුය

III. * සීමාසහිත පෞද්ගලික සමාගම

* 2007 අංක 7 දරණ සමාගම් පනත

IV. * ව්‍යවසායකයින්ට නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා උනන්දුව ඇති කිරීම.

* ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර අදහස් ව්‍යාපාර බවට පරිවර්තනය කිරීමට අවස්ථාව ලබා දීම.

V. * ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම.

* ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම ස්ථාපිත වීම.

* පැන නැගිය හැකි නීතිමය ප්‍රශ්න අවම වීම.

* ව්‍යාපාරයේ භාණ්ඩ හෝ සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළයාම මගින් ඉහළ ලාභ දායකත්වයක් සහතික වීම.

6.

I. කිසියම් අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු කර පිළියෙල කරනු ලබන ලේඛනයයි.

II.

* නිෂ්පාදන ක්‍රියාවලිය

* නිෂ්පාදන ස්ථාවර පිරිවැය

* නිෂ්පාදන පිරිවැය

* ඒකක පිරිවැය

III. අලෙවි සැලැස්මකදී පුරෝකථනය කළ අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාව නිපදවන්නේ කෙසේදැයි විස්තර කිරීම නිෂ්පාදන ක්‍රියාවලියෙන් සිදු වේ. උදාහරණ - මැටි ගඩොල

| යෙදවුම | පරිවර්තන ක්‍රියාවලිය | නිමවුම |
|---|---|---|
| මැටි | මැටි ඇනීම | |
| ජලය | ගඩොල් කැපීම | මැටි ගඩොල |
| උපකරණ | වේලීම | |
| ශ්‍රමය | ඇසිරීම | |

IV. * පාරිභෝගිකයින්ට ප්‍රශ්නාවලි ලබා දී පිළිතුරු මගින්
 * පාරිභෝගිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම.

V. * නිෂ්පාදිතය (Product)
 * මිල (Price)
 * ස්ථානය (Place)
 * ප්‍රවර්ධනය (Promotion)

7.

සඳුන්ගේ ව්‍යාපාරයේ

2018 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | රු. | රු. |
|---|---|---|
| **මුදල් ගලා ඒම්** | | |
| සඳුන් ව්‍යාපාරයට මුදල් යෙදවීම | 800 000 | |
| බැංකු ණය ලබාගැනීම | 300 000 | |
| විකුණුම් ආදායම | 2 000 000 | |
| ණයගැති යන්නෙන් ලැබීම් | 100 | |
| මුළු මුදල් ගලා ඒම් | 000 | 3 200 000 |
| **මුදල් ගලා යාම්** | | |
| ණය හිමියන්ට ගෙවීම | | |
| ණය වාරික ගෙවීම හා පොළිය | 50 000 | |
| සේවක වැටුප් ගෙවීම | 75 000 | |
| ජල බිල්පත් ගෙවීම | 100 000 | |
| විදුලි බිල්පත් ගෙවීම | 20 000 | |
| ලියාපදිංචි ගාස්තු ගෙවීම | 28 000 | |
| භාණ්ඩ මිළට ගැනීම | 2000 | |
| උපකරණ මිළට ගැනීම | 900 000 | |
| මුළු මුදල් ගලා යාම් | 200 000 | 1 375 000 |
| **කාලච්ඡේදයේ මුදල් ශේෂය** | | 1 825 000 |

(II) රු. 1 825 000

(III) 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනතට අනුව අදාළ පළාත් සභාවේ ව්‍යාපාරය පවතින බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්